# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
# பொலிஸ் ஊடகப் பிரிவு
# POLICE MEDIA DIVISION
සෙත්සිරිපාය, බත්තරමුල්ල

තැ.පෙ.අංකය / த. பெ.இ / Po.Box No — 10120

ෆැක්ස් / தொலைநகல / Fax — 011-2171635

දුරකථන / தொலைபேசி / Telephone — 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය / இணையதளம் / Web Site — www.Police.lk

ඊ මේල් / மின்னஞ்சல் / E-mail — dir.media@police.gov.lk


මගේ අංකය / எனது இலக்கம் / My NO — 798/2024

ඔබේ අංකය / உமது இலக்கம் / Your No — / 2024

දිනය / திகதி / Date — 11/05/2024

පැය 1500

## මාධ්‍ය නිවේදනය

**පොලිස් විශේෂ කාර්ය බලකාය විසින් සිදු කරන ලද වැටලීම් සම්බන්ධ තොරතුරු ජන මාධ්‍ය වෙත යොමු කිරිම.**

**01. 2024.05.10 වන දින පොලිස් විශේෂ කාර්ය බලකා නිලධාරීන් විසින් සිදු කරන ලද නීති විරෝධී මත්පැන් වැටලීම් සම්බන්ධ වාර්තාව පහත පරිදි වේ.**

| වැටලීම් ගණන | අත්අඩංගුවට ගත් සැකකරුවන් ගණන | නීති විරෝධී මත්පැන් ප්‍රමාණය (ලීටර්) | ගෝඩා ප්‍රමාණය (ලීටර්) | වෙනත් දේපල |
|---|---|---|---|---|
| 05 | 05 | 120 | 720 | තඹ දඟර 01<br>යකඩ බැරල් 03<br>බූලි<br>ගෑස් සිලින්ඩර්<br>ගෑස් ලිප් |

වැටලීම් සිදු කර අත්අඩංගුවට ගන්නා ලද සැකකරු හා දේපල අදාළ පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**02. අයිස් මත්ද්‍රව්‍ය සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා ත්‍රිකුණාමලය කඳවුර**

2024.05.10 වන දින උදෑසන කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා ත්‍රිකුණාමලය කඳවුරේ නිලධාරීන් කණ්ඩායමක් විසින් අත්අඩංගුවට ගන්නා ලද සැකරුවන්ගෙන් ප්‍රශ්න කිරීමේදී අනාවරණය කර ගන්නා ලද තොරතුරු මත ග්‍රෑන්ඩ්පාස් පොලිස් වසමේ ස්වේස් පාර ප්‍රදේශයේදී වැටලීමක් සිදු කර **අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 06 මිලිග්‍රෑම් 500 ක් සමඟ** සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ග්‍රෑන්ඩ්පාස් පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 24 ක් වූ කොළඹ 14 ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වේ.** ග්‍රෑන්ඩ්පාස් පොලිසිය වැඩිදුර විමර්ශන පවත්වාගෙන යනු ලබයි.

**03. හෙරොයින් මත්ද්‍රව්‍ය සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා ගෝනහේන කඳවුර**

2024.05.10 වන දින රාත්‍රී කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා ගෝනහේන කඳවුරේ නිලධාරීන් කණ්ඩායමක් විසින් මට්ටක්කුලිය පොලිස් වසමේදී වැටලීමක් සිදු කර **හෙරොයින් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 05 මිලිග්‍රෑම් 230ක් සමඟ** සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන මට්ටක්කුලිය පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 40 ක් වූ කොළඹ 15 ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වේ.** මට්ටක්කුලිය පොලිසිය වැඩිදුර විමර්ශන පවත්වාගෙන යනු ලබයි.

**04. අයිස් මත්ද්‍රව්‍ය සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා ත්‍රිකුණාමලය කඳවුර**

2024.05.10 වන දින උදෑසන කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා ත්‍රිකුණාමලය කඳවුරේ නිලධාරීන් කණ්ඩායමක් ත්‍රිකුණාමලය පොලිස් වසමේ ත්‍රිකුණාමලය බස් නැවතුම්පොල ආසන්න ප්‍රදේශයේදී වැටලීමක් සිදු කර **අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 15 ක් සමඟ** සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ත්‍රිකුණාමලය පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 23 ක් වූ කොළඹ 13 ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වේ.** ත්‍රිකුණාමලය පොලිසිය වැඩිදුර විමර්ශන පවත්වාගෙන යනු ලබයි.

**05. අයිස් මත්ද්‍රව්‍ය සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා ත්‍රිකුණාමලය කඳවුර**

2024.05.10 වන දින උදෑසන කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා ත්‍රිකුණාමලය කඳවුරේ නිලධාරීන් කණ්ඩායමක් ත්‍රිකුණාමලය පොලිස් වසමේ ත්‍රිකුණාමලය බස් නැවතුම්පොල ආසන්න ප්‍රදේශයේදී වැටලීමක් සිදු කර **අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 05 ක් සමඟ** සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ත්‍රිකුණාමලය පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 30 ක් වූ කොළඹ 13 ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වේ.** ත්‍රිකුණාමලය පොලිසිය වැඩිදුර විමර්ශන පවත්වාගෙන යනු ලබයි.